ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017 මැයි මස 04 වැනි දින |

## 2017 ජනවාරි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

2017 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය. ආනයන වියදම ඉහළ යෑම සහ අපනයන ආදායම අඩුවීම හේතුවෙන් ජනවාරි මාසය තුළ දී වෙළඳ හිඟය පුළුල් විය. කෙසේ නමුත්, 2017 ජනවාරි මාසයේ දී සංචාරක ඉපැයීම් තුළින් වූ විදේශ විනිමය ලැබීම් සාපේක්ෂව ඉහළ වර්ධනයක් වාර්තා කළ අතර, පෙර වසරේ අනුරූප මාසය සමඟ සැසඳීමේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මධ්‍යස්ථ ප්‍රමාණයකින් වර්ධනය විය. 2017 ජනවාරි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ශුද්ධ විදේශ විනිමයේ ගලා යෑමක් දැකිය හැකි විය.

### අපනයන ක්‍රියාකාරිත්වය

කෘෂිකාර්මික අපනයන ආදායමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණ ද ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ආදායමෙහි මන්දගාමී ක්‍රියාකාරිත්වය පිළිඹිබු කරමින් අපනයන ආදායම 2016 ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 899 ට සාපේක්ෂව 2017 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 865 ක් දක්වා සියයට 3.8 කින් පහළ ගියේය.

2017 වසරේ ජනවාරි මාසයේ දී මුළු අපනයන ආදායමෙන් සියයට 77 ක් වූ කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 668 ක් දක්වා සියයට 6.7 කින් පහළ ගියේය. මෙම අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා

ඇඟලුම්, රබර් නිෂ්පාදිත සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම පහළ යෑම හේතු විය. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුමෙහි අඩුවීමක් පිළිඹිබු කරමින් 2017 වසරේ ජනවාරි මාසයේ මුළු අපනයන ආදායමෙන් සියයට 49 ක් පමණ වූ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 426 ක් දක්වා සියයට 8.2 කින් පහළ ගියේය. සියලුම උපකාණ්ඩවල අපනයනවල පහළ යෑමක් පිළිඹිබු කරමින් රබර් නිෂ්පාදිත සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම් පිළිවෙළින් සියයට 18.7 කින් සහ සියයට 28.8 කින් පහළ ගියේය. මීට අමතරව, 2017 වසරේ ජනවාරි මාසයේ දී කාර්මික අපනයන ආදායම පහළ යෑම සඳහා සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් අපනයන ආදායම් පහළ යෑමද සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මූල ලෝහ හා උපාංග, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ දැව හා කඩදාසි නිෂ්පාදිත අපනයන ආදායම් 2017 ජනවාරි මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

සුළු කෘෂිකාර්මික අපනයන සහ සකස් නොකළ දුම්කොළ යන උපකාණ්ඩ හැරුණු විට අනෙකුත් සියලුම උපකාණ්ඩවල අපනයන ආදායම්වල ඉහළ යෑම් පිළිඹිබු කරමින් 2017 ජනවාරි මාසයේ කෘෂිකාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 194 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 7.9 කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම කරාබු නැටි, සාදික්කා හා වසාවාසි සහ කුරුඳු නිෂ්පාදිතවල යහපත් ක්‍රියාකාරිත්වය හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 33.7 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. මීට අමතරව, විශේෂයෙන්ම යුරෝපා සංගමය වෙතින් වූ මුහුදු ආහාර අපනයන ආදායම සියයට 107.3 කින් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ ජනවාරි මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම සියයට 19.7 කින් ඉහළ ගියේය. අපනයන පරිමාව අඩු වුවද, 2016 වසරේ සැප්තැම්බර් මාසයේ සිට පැවති තේ සඳහා සාමාන්‍ය අපනයන මිල ඉහළ යෑමේ ප්‍රවණතාව හේතුවෙන් මුළු අපනයන ආදායමෙන් සියයට 12 ක් වූ තේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 2.1 කින් ඉහළ ගියේය.

2017 වසරේ ජනවාරි මාසයේ දී, ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයන සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ප්‍රධාන වෙළඳපොළ වූ අතර, එම රටවල් සඳහා සිදුකළ අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 53 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2016 (ආ) ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **716.2** | **668.0** | **(6.7)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 464.4 | 426.3 | (8.2) |
| එයින් ඇඟලුම් | 441.6 | 405.2 | (8.2) |
| රබර් නිෂ්පාදිත | 71.3 | 58.0 | (18.7) |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 28.6 | 29.5 | 3.1 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 20.7 | 26.0 | 25.7 |
| ආහාර පාන හා දුම්කොළ | 25.6 | 22.1 | (14.0) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 30.6 | 21.8 | (28.8) |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 8.7 | 11.2 | 29.7 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 12.2 | 9.3 | (23.7) |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත උපාංග | 4.2 | 8.2 | 96.6 |
| ප්‍රවාහන උපකරණ | 5.6 | 7.3 | 29.5 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.9 | 4.6 | 141.6 |
| වෙනත් | 42.4 | 43.8 | 3.4 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **179.5** | **193.7** | **7.9** |
| තේ | 99.4 | 101.6 | 2.1 |
| කුළුබඩු | 22.8 | 30.4 | 33.7 |
| පොල් | 24.5 | 27.3 | 11.5 |
| මුහුදු ආහාර | 15.2 | 18.2 | 19.7 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.5 | 7.3 | (23.7) |
| රබර් | 3.5 | 5.0 | 45.1 |
| සකස් නොකළ දුම්කොළ | 2.8 | 2.0 | (26.9) |
| එළවළු | 1.8 | 1.8 | 1.3 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **2.9** | **3.0** | **3.7** |
| **මුළු අපනයන** | **898.6** | **864.7** | **(3.8)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

**ආනයන ක්‍රියාකාරිත්වය**

අඛණ්ඩව සිව්වැනි මාසයටත් ආනයන වියදමෙහි වර්ධනය අංක දෙකක අගයක් පෙන්නුම් කරමින්, 2017 වසරේ ජනවාරි මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,798 ක් දක්වා සියයට 13.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්ම අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම බලපෑ අතර, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම ද හේතු විය. කෙසේ වුවද, 2016 වසරේ ජනවාරි මාසයේ සිට දක්නට ලැබුණු පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑමේ ප්‍රවණතාව වෙනස් වෙමින් 2017 වසරේ ජනවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

2017 වසරේ ජනවාරි මාසයේ අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 950 ක් දක්වා සියයට 18.6 කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ පිරිපහදු කළ ඛනිජතෙල් ආනයන වියදම ඉහළ යෑමෙන් ඉන්ධන ආනයන වියදම ඉහළ යෑමයි. පිරිපහදු කළ ඛනිජතෙල් ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 101.6 කින් ඉහළ ගිය අතර, ජාත්‍යන්තර තෙල් මිල ගණන් ඉහළ යෑම මෙන්ම පවතින නියං තත්ත්වයන් සමඟ ඉහළ ගිය තාප විදුලි බල උත්පාදනය සඳහා ඛනිජතෙල් ආනයන පරිමාව ඉහළ යෑම, මේ සඳහා හේතු විය. මීට අමතරව, 2017 වසරේ ජනවාරි මාසයේ දී රත්‍රං ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 64 ක් ලෙස වාර්තා කරමින් අඛණ්ඩව ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර, මූල ලෝහ යටතේ වර්ග කර ඇති යකඩ හා වානේ ආනයන වියදම ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2017 ජනවාරි මාසයේ දී, ශ්‍රී ලංකාවේ දෙවැනි ප්‍රධාන ආනයන භාණ්ඩය වන රෙදිපිළි හා රෙදිපිළි උපාංග සඳහා වූ ආනයන වියදම සියයට 0.8 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 වසරේ ජනවාරි මාසයේ දී තිරිඟු හා ඉරිඟු, පොහොර හා බොරතෙල් ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසය හා සැසඳීමේ දී පහළ ගියේය.

2017 වසරේ ජනවාරි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2016 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 344 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 359 ක් දක්වා සියයට 4.4 කින් ඉහළ ගියේය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම සීනි, සහල්, කිරි හා ක්‍රීම් සහ කරවල සඳහා වූ වියදම් හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම් ඉහළ යෑම හේතු විය. මෙයට වෙනස්ව යමින් 2017 ජනවාරි මාසයේ දී මෝටර් රථ, බෙහෙත් වර්ග සහ මුද්‍රිත ද්‍රව්‍ය මූලික කරගත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදයේ දී යතුරු පැදි, ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර සහ රෙදිපිළි ආනයන වියදම් ඉහළ ගියේය.

2017 ජනවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 444 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 432 ක් දක්වා සියයට 2.6 කින් පහළ ගියේය. මෙම අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන්ම, ත්‍රී රෝද රථ මූලික කරගත් ප්‍රවාහන උපකරණ ආනයන වියදම පහළ යෑමත්, ඇඟලුම් කර්මාන්තය සඳහා භාවිතා කරන යන්ත්‍රසූත්‍ර මූලික කරගත් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම පහළ යෑමත් හේතු විය. කෙසේ වුවද , යකඩ හා වානේ, දැව සහ පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදිත වැනි භාණ්ඩවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ ජනවාරි මාසයේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සුළු වශයෙන් ඉහළ ගියේය.

2017 ජනවාරි මාසය තුළ ඉන්දියාව, චීනය, සිංගප්පූරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ජපානය ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර, මෙම රටවල් වෙතින් සිදු කරන ලද ආනයන මුළු ආනයනවලින් සියයට 59 ක් පමණ විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම (අ)


| කාණ්ඩය | 2016 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **343.5** | **358.8** | **4.4** |
| ආහාර හා පානවර්ග | 118.6 | 143.6 | 21.0 |
| එළවළු | 44.3 | 38.6 | (12.8) |
| සීනි හා රසකැවිලි | 9.6 | 22.0 | 129.5 |
| කිරි නිෂ්පාදිත | 18.1 | 21.1 | 16.7 |
| මුහුදු ආහාර | 15.9 | 18.2 | 14.1 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.8 | 12.7 | 596.5 |
| කුළුබඩු | 10.9 | 9.5 | (12.9) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 18.1 | 21.5 | 19.0 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 224.9 | 215.2 | (4.3) |
| රථවාහන | 86.9 | 66.0 | (24.1) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 41.5 | 38.9 | (6.3) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 96.4 | 110.3 | 14.4 |
| **2. අන්තර් භාණ්ඩ** | **801.2** | **950.1** | **18.6** |
| ඉන්ධන | 174.8 | 282.2 | 61.4 |
| එයින් බොරතෙල් | 45.3 | 41.4 | (8.6) |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 101.5 | 204.7 | 101.6 |
| ගල්අඟුරු | 28.0 | 36.1 | 29.0 |
| දියමන්ති සහ අගනා ගල් හා ලෝහ වර්ග | 24.7 | 69.0 | 179.2 |
| එයින් රත්‍රන් | 15.5 | 64.1 | 314.8 |
| මූල ලෝහ | 30.9 | 38.4 | 24.2 |
| කඩදාසි හා ඝන කඩදාසි ආශ්‍රිත නිෂ්පාදිත | 42.5 | 34.1 | (19.9) |
| තිරිඟු හා ඉරිඟු | 43.0 | 30.7 | (28.7) |
| රථවාහන හා යන්ත්‍ර කොටස් | 21.5 | 28.7 | 33.4 |
| පොහොර | 11.8 | 4.2 | (64.7) |
| සකස් නොකළ දුම්කොළ | 4.7 | 3.4 | (28.3) |
| වෙනත් | 447.2 | 459.6 | 2.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **443.9** | **432.2** | **(2.6)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 255.5 | 250.6 | (1.9) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 135.0 | 136.0 | 0.7 |
| ප්‍රවාහන උපකරණ | 52.6 | 44.3 | (15.8) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.9 | 1.4 | 57.7 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.5** | **57.3** | **11,678.9** |
| **මුළු ආනයන** | **1,589.1** | **1,798.4** | **13.2** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

### වෙළඳ ශේෂය

අපනයන ආදායම අඩුවීමත්, ආනයන වියදම ඉහළ යෑමත් හේතුවෙන් 2017 ජනවාරි මාසයේ දී වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අනුව, වෙළඳ හිඟය 2016 ජනවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 691 හා සැසඳීමේ දී 2017 ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 934 ක් දක්වා පුළුල් විය.

### සංචාරක ඉපැයීම්

සංචාරක පැමිණීම්වල අඛණ්ඩ වර්ධන ප්‍රවණතාවය තවදුරටත් පවත්වා ගනිමින්, 2017 ජනවාරි මාසයේ දී පැමිණි සංචාරකයින් ප්‍රමාණය 219,360 ක් වූ අතර, එය පෙර වසරේ අනුරූප මාසයේ සංචාරක පැමිණීම් සමඟ සැසඳීමේ දී සියයට 12.9 ක වර්ධනයකි. 2017 ජනවාරි මාසයේ දී ඉන්දියාව අභිබවා යමින් සංචාරක පැමිණීම්වල ප්‍රමුඛතම මූලාශ්‍රය බවට චීනය පත් වූ අතර, එක්සත් රාජධානිය, ජර්මනිය හා ප්‍රංශය යන රටවල් සංචාරකයන් පැමිණි අනෙකුත් ප්‍රධාන රටවල් විය. එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 2017 ජනවාරි මාසයේ වාර්තා වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 48.1 ක් විය. 2017 ජනවාරි මාසයේ සංචාරක ඉපැයීම් ද 2016 වසරේ ජනවාරි මාසය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 376.3 ක් දක්වා සියයට 12.9 කින් වර්ධනය විය.[1]

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2017 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

මැද පෙරදිග කලාපය තුළ පැවති අහිතකර ආර්ථික හා භූ දේශපාලනික තත්ත්වය හේතුවෙන් පෙර වසරේ දී පැවති විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම්වල වූ මධ්‍යස්ථ ප්‍රවණතාව 2017 වසරේදී ද අඛණ්ඩව දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 ජනවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම්, 2016 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 563.4 සිට එ.ජ. ඩොලර් මිලියන 571.6 දක්වා සියයට 1.4 කින් සුළු වශයෙන් වර්ධනය විය.

**මූල්‍ය ලැබීම්**

ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ ලැබීම් සැලකිය යුතු ප්‍රමාණයක් වාර්තා නොකළ නමුත්, ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ ගෙවීම් මුළුමනින්ම පිළිඹිබු කරමින් කොළඹ කොටස් වෙළඳපොළ විදේශීය ආයෝජන 2017 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 11.0 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. පසුගිය වසරේ අවසාන මාස කිහිපය තුළ පිළිඹිබු කළ ප්‍රවණතාව අඛණ්ඩව තවදුරටත් පවත්වා ගනිමින් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2016 වසරේ අනුරූප මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 118.3 ක ශුද්ධ ගෙවීම සමඟ සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 150.7 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. රජය වෙත ලැබුණු දිගුකාලීන ණය, 2016 ජනවාරි මාසයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 5.3 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව 2017 ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 24.4 ක් දක්වා වැඩි විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2017 ජනවාරි මාසයේ දී සමස්ත ගෙවුම් තුලනය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 619.3 ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 211.7 ක හිඟයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2017 වසරේ ජනවාරි මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.3 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 5.5 ක් විය. දළ නිල සංචිතවලින් හා තැන්පතු භාරගන්නා ආයතන සතු විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 4.6 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.6 ක් විය.

2016 වසරේ දී එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 3.8 ක අවප්‍රමාණය වීමක් වාර්තා කළ ශ්‍රී ලංකා රුපියල 2016 වසර අවසානයේ සිට 2017 මැයි මස 03 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී, තවදුරටත් සියයට 1.4 ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතිකවල හැසිරීම පිළිබිඹු කරමින් 2017 මැයි මස 03 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝවලට එරෙහිව සියයට 4.9 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 6.8 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 6.4 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 5.1 කින් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 5.1 කින් ද අවප්‍රමාණය වූ අතර, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 0.4 කින් අතිප්‍රමාණය විය.

### සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 ජන. (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|
| අපනයන | 898.6 (ආ) | 864.7 | -3.8 |
| ආනයන | 1,589.1 | 1,798.4 | 13.2 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/ හිඟය(-)) | -690.5(ආ) | -933.7 | 35.2 |
| සංචාරක ඉපැයීම් | 333.3(ආ) | 376.3 | 12.9 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 563.4 | 571.6 | 1.4 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -18.9 | -11.0 | -41.8 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 90.4 | 200.4 | 121.6 |
| එයින්, | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 13.2 | 82.8 | 526.3 |
| දිගුකාලීන ණය | 72.7 | 117.3 | 61.4 |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.